# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2360/59 - 2023 නොවැම්බර් මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2023.11.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 98 වන ව්‍යවස්ථාවේ (8) වන අනුව්‍යවස්ථාව යටතේ නියමය

2021 අංක 22 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව 2023 වර්ෂයේ ජුනි මස 01 වැනි දිනෙන් ආරම්භ වී 2023 වර්ෂයේ සැප්තැම්බර් මස 30 වන දින දක්වා කාල පරිච්ඡේදයට අදාළ 2023 (2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය 2023 ඔක්තෝබර් දෙවන දින සහතික කළ බව අංක 2352/04 හා 2023.10.02 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* දැනුම් දෙන ලදී.

02. 2023 ඔක්තෝබර් මස 02 දිනට 2022 වර්ෂයේ ප්‍රධාන නාමලේඛනය, 2022 (1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය, 2022 (2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය, 2022 (3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය හා 2023 (1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය හා 2023 (2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය වලංගුව පවතින අතර ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98 වන ව්‍යවස්ථාවේ (8) වන අනුව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම නියමය මගින්, 97 වන ව්‍යවස්ථාව යටතේ වූ ප්‍රකාශනය ප්‍රකාර සහ 98 වන ව්‍යවස්ථාව ප්‍රකාරව, මෙහි උපලේඛනයෙහි I වන තීරයෙහි නිශ්චය කොට දක්වා ඇති එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් තෝරාපත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව ඒ උපලේඛනයේ II තීරයේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති සංඛ්‍යාව වියයුතු බව, සහතික කරනු ලැබේ.

ආර්. එම්. ඒ. එල්. රත්නායක,
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

එම්. ඒ. පී. සී. පෙරේරා,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

අමීර් ෆායිස්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

අනුසූයා ෂන්මුගනාදන්,
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2023 නොවැම්බර් මස 30 වැනි දින,
රාජගිරිය,
මැතිවරණ කොමිෂන් සභාවේ දී ය.


1A - G 40890 — 21 (2023/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

| *I වන තීරය*<br>*මැතිවරණ කොට්ඨාසයේ නම* | *II වන තීරය*<br>*එක් එක් මැතිවරණ කොට්ඨාසය විසින් තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව* |
|---|---|
| 01 - කොළඹ | 19 |
| 02 - ගම්පහ | 18 |
| 03 - කළුතර | 10 |
| 04 - මහනුවර | 12 |
| 05 - මාතලේ | 5 |
| 06 - නුවරඑළිය | 8 |
| 07 - ගාල්ල | 9 |
| 08 - මාතර | 7 |
| 09 - හම්බන්තොට | 7 |
| 10 - යාපනය | 7 |
| 11 - වන්නි | 6 |
| 12 - මඩකලපුව | 5 |
| 13 - දිගාමඩුල්ල | 7 |
| 14 - ත්‍රිකුණාමලය | 4 |
| 15 - කුරුණෑගල | 15 |
| 16 - පුත්තලම | 8 |
| 17 - අනුරාධපුරය | 9 |
| 18 - පොළොන්නරුව | 5 |
| 19 - බදුල්ල | 9 |
| 20 - මොනරාගල | 6 |
| 21 - රත්නපුර | 11 |
| 22 - කෑගල්ල | 9 |
| | **196** |

EOG 11 - 0348

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.